**රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2013**

------------------------------------------------------------------------

රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ විගණන මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගාල්ල රේගු උපනිවාරණ කාර්යාලය සඳහා මිලදීගත් රු. 104,720 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රය පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ වැරදි සහගත ලෙස ප්‍රාග්ධනීත කළ වත්කමක් හා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ වත්කමක් සඳහා ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.374,817 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පුස්තකාල පොත් ක්ෂය වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.97,403 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු.136,343,215 ක් වූ ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI /2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව විස්තර සවිස්තරාත්මකව වෙනම ලේඛනයක පවත්වා නොතිබුණි. |

**2.3** **පැහැදිලි නොකළ වෙනස්කම්**

අංක CE/MO/RL/15/2012 දරණ සිද්ධියට අදාළව අරමුදලට මාරු කරන ලද රු.405,594 ක මුදල මාසික සාරාංශ මඟින් භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.405,594 ක වෙනසක් පැවතුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු. 478,770,293 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.322,866,312 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 155,903,981 ක වර්ධනයක් නිරීක්ෂණය විය. අරමුදලේ දණ්ඩන ආදායම සහ වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 94.59 කින් හා සියයට 363.9 කින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවී තිබීම, මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට මූලික වශයෙන් බලපා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අරමුදලේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳව විග්‍රහයක් පහත දැක්වේ.

| ආදායම/ වියදම | 2013 වර්ෂය | ආදායම/ වියදම මුළු ආදායමේ/ මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස | 2012 වර්ෂය | විචලනය | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| **ආදායම** | රු. "000" | | රු. "000" | රු. "000" | |
| විකුණුම් | 109,869 | 19 | 115,092 | (5223) | (5) |
| දණ්ඩන | 479,999 | 81 | 246,677 | 233,322 | 95 |
| වෙනත් ආදායම් | 3,019 | 1 | 651 | 2,368 | 364 |
| **මුළු ආදායම** | 592,887 | 100 | 362,420 | 230,467 | 64 |
| **වියදම** | | | | | |
| දේශීය පුහුණු | 12,063 | 11 | 10,460 | 1,603 | 15 |
| විදේශීය පුහුණු | 51,314 | 45 | 21,916 | 29,398 | 134 |
| පශ්චාත් උපාධි පාඨමාලා | 26,107 | 23 | 2,600 | 23,507 | 904 |
| වෙනත් වියදම් | 24,633 | 22 | 4,578 | 20,055 | 438 |
| මුළු වියදම | 114,117 | 100 | 39,554 | 74,563 | 189 |
| **අතිරික්තය** | 478,770 | | 322,866 | 155,904 | 48 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු පරීක්ෂණ මගින් අල්ලාගත් භාණ්ඩ සඳහා පනවන ලද දණ්ඩන හා අල්ලාගත් භාණ්ඩ විකිණීමෙන් ලද ආදායමින් සියයට 50 ක ප්‍රමාණයක් ත්‍යාග සඳහා වෙන්කිරීමෙන් පසු ඉතිරි සියයට 50 ක මුදලින් සියයට 40 ක් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ දණ්ඩන හා රාජසන්තක භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම් තුළින් ලද බැරකිරීම් පිළිවෙලින් සියයට 81 ක් හා සියයට 19 දායකත්වයක් අරමුදලට ලබා දී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ විදේශීය පුහුණු වීම් සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පිළිවෙලින් රු. මිලියන 51.31 ක් ද, රුපියල් මිලියන 26.11 ක්ද වැය කර තිබූ අතර, එය මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 45 ක් හා 23 ක් විය.

(ඇ) දේශීය පුහුණුවීම් සඳහා මුළු වියදමින් සියයට 22 ක් වෙනත් වියදම් යටතේ වැයකර තිබියදී, කළමනාකරණ සඵලතාවය වර්ධනය සඳහා දේශීය පුහුණු වීම් වෙනුවෙන් සියයට 11 ක් වූ අඩු පිරිවැයක් දරා තිබූ අතර මේ අනුව, දේශීය පුහුණු කිරීම් යාන්ත්‍රණය වර්ධනය කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) රේගු නිලධාරීන්ගේ සඵලතාවය වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වැය දැරීමත්, අනතුරුවලට ලක්වන නිලධාරීන්ට වන්දි ගෙවීමත් මෙම අරමුදලේ ප්‍රධාන අරමුණු වේ. කෙසේ වුවද රේගු කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා වූ නිශ්චිත නිර්ණායකයන් හඳුනා ගැනීමකින් තොරව මෙම අරමුදලට මුදල් වෙන්කිරීම නිසා අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව වර්ධනය වෙමින් පවතී. ඒ අනුව 2012 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,410 ක් වූ සමුච්චිත අරමුදලේ ශේෂය 2013 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,889 ක් වූ අතර එය රු. මිලියන 479 ක වර්ධනයක් විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

විදේශ පුහුණු වැඩ සටහන් හා විදේශ වැඩමුළු සඳහා සහභාගී වන නිලධාරීන් තෝරා ගැනීමේදී ඒ සඳහා පැහැදිලි නිර්ණායකයන් හඳුනාගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාපරිපාටීන් අනුගමනය නොකළ අවස්ථා නිරීක්ෂණය විය. අවස්ථා දෙකකදී පවත්වන ලද විදේශ වැඩමුළු සඳහා නිලධාරීන් අවිධිමත් ලෙස පත්කර සහභාගී කරවා තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 05 කදී එකතුව රු.6,058,478 ක වියදම් විසර්ජන වැය ශීර්ෂය යටතේ දැරිය යුතු වුවත්, එම වියදම් අරමුදලින් වැය කර තිබුණි. අදාළ වියදම් දරා ඇත්තේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම තුළින් කළමනාකරණය වර්ධනය කිරීම සඳහා බවට රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිතුරු සපයා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය**

-----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 ප්‍රකාරව අරමුදල් වල වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2014 මැයි 02 දිනදීය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනය මඟින් අනුමත කර නොතිබූ වැය විෂයයන් 04 ක් සඳහා රු.14,778,674 ක් අරමුදල මඟින් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයයන් 3 ක් සඳහා ඇස්තමේන්තුගත වියදම් සීමාව ඉක්මවා රු. 102,777,090 ක් වැය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ තථ්‍ය ආදායම් / වියදම් හා අයවැය ගත ආදායම් / වියදම් අතර සියයට 100 දක්වා වන විචලනයන් අවස්ථා තුනකදී නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය, නෛතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා පිළියෙල කෙරෙන බවත්, ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා නොකෙරෙන බවත් නිරීක්ෂණය විය.

(ඈ) දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් තුනක් සඳහා ප්‍රතිපාදන මුදලට අතිරේකව රු.මිලියන 93.3 ක් කළමනාකරණ හා වන්දි අරමුදලින් වැය කර තිබුණි.

(ඉ) 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දිනට පෙර අනුමත කර ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සඳහා අනුමැතිය ලැබී තිබුණේ 2013 අප්‍රේල් 17 දින එනම්, මාස 07 ක කාල ප්‍රමාදයක් සහිතවය.

## 6. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතාවය වැඩි දියුණු කිරීම සඳහා නිර්ණායකයන් හඳුනා ගැනීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) අරමුදල් උපයෝජනය
(ඈ) සැසඳුම් ක්‍රියාවලිය
(ඉ) විදේශ ගමන් වියදම්
(ඊ) අයවැය
(උ) ගිණුම්කරණය